# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2105/28 - 2019 ජනවාරි මස 09 වැනි බදාදා - 2019.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය:* YAK/LAN/01/03/05.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය :* 4-3/8/2014/පිසී/274.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ තල්පෙ පත්තුව උතුර යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 177D යක්කලමුල්ල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ, බෙරණගොඩ ගමේ පිහිටි, සර්වේ ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද අවසන් ගම් පිඹුරු අංක 641හි අතිරේක අංක 29හි පත්‍ර අංක 32හි කැබලි අංක 1310, 1311, 1312 ලෙස පෙන්නුම් කර ඇති හෙක්ටයාර් 0.0038 ක් වූ පහත නම් වලින් හා මායිම් වලින් යුත් බිම් කොටසක් සම්බන්ධයෙනි.

**කැබලි අංක 1310**
ඉඩමේ නම: කජුගහලියද්ද, ජම්බුගහලියද්ද; ඉඩම් පරිහරණය: කුඹුර සහ මාර්ගය (කොටසක්); හිමිකම් කියන අය: රංජිත් ඩයස්, ඉදගහගොඩැල්ල, යක්කලමුල්ල ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0033.

**කැබලි අංක 1311**
ඉඩමේ නම: කජුගහලියද්ද, ජම්බුගහලියද්ද; ඉඩම් පරිහරණය: කුඹුර සහ මාර්ගය (කොටසක්); හිමිකම් කියන අය: රංජිත් ඩයස්, ඉදගහගොඩැල්ල, යක්කලමුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0003.

**කැබලි අංක 1312**
ඉඩමේ නම: කජුගහලියද්ද, ජම්බුගහලියද්ද; ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් කියන අය: රංජිත් ඩයස්, ඉදගහගොඩැල්ල, යක්කලමුල්ල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0002.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2019 පෙබරවාරි මස 13 වැනි දින පෙ. ව. 10.00 ට යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019.02.06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලත් දැනුම් දිය යුතුය.

වන්දිම සී. මුහන්දිරම්ගේ,
ප්‍රාදේශීය ලේකම්,
යක්කලමුල්ල.

2019 ජනවාරි මස 04 වැනි දින,
යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01– 585

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G29213 – 17 (2019/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.